**ලංකා පිහන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය - 2018**

---

## 1.1. අහිතකර මතය

ලංකා පිහන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ අහිතකර මතය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අහිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4. විගණන විෂය පථය

-------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 | | |
| (I) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ ප්‍රමිතයේ 38 වන ඡේදය ප්‍රකාරව පසුගිය කාලපරිච්ඡේදයේ සන්සන්දනාත්මක තොරතුරු හෙළිදරව් කළ යුතු වුවත්, 2018 දෙසැම්බර් 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී 2017 වර්ෂයේ සන්සන්දනාත්මක තොරතුරු හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි වසරේ සිට නිවැරදි කරමි. | ගිණුම්කරණ ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (II) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ ප්‍රමිතයේ 110 වන ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 අනුව අතීතානුයෝගීව ගැළපීම් කිරීමේදී ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම් සහ වැරදි නිවැරදි කිරීම් මගින් ඇති වූ ප්‍රතිඵලය ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශයේ වෙනම හෙළිදරව් නොකර, 2018 දෙසැම්බර් 31 දිනට එකතුව රු.559,463 ක් පසුගිය වර්ෂ ගැළපීම් ලෙස ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශයේ සටහන් කර තිබුණි. | ඉදිරි වසරේ සිට නිවැරදි කරමි. | ගිණුම්කරණ ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 02<br>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02 තොග පිළිබඳ ප්‍රමිතයේ 34 වන ඡේදය ප්‍රකාරව තොගය සම්බන්ධව හඳුනාගෙන ආදායම් ප්‍රකාශයට කපා හැර තිබූ රු.462,518 ක් වූ පාඩුව පිළිබඳව ප්‍රමිතයේ 36 (ඊ) ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේදී ලබාදී ඇති උපදෙස් අනුව කටයුතු කරමි | ගිණුම්කරණ ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16<br>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 දේපළ පිරියත හා උපකරණ පිළිබඳ ප්‍රමිතයේ 19 (ඩී) ඡේදයට පටහැනිව එරගම කම්හලේ පෝරණුව අළුත්වැඩියාව සඳහා මිලදී ගත් අමුද්‍රව්‍ය ඇතුළු පොදු කාර්යය වියදම් වූ එකතුව රු.108,854 ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ හිඟ බදු වාර්තාව අනුව ගෙවිය යුතු වැට් බදු ශේෂය රු.53,863,568 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු වැට් බදු වටිනාකම රු.53,744,967 ක් ලෙස සටහන් කිරීම නිසා ගෙවිය යුතු වැට් බදු ගිණුමේ ශේෂය රු.118,601 ක් අඩුවෙන් සටහන් කර තිබුණි. | ඉදිරියේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර මෙය නිවැරදි කරනු ඇත. | පිළිතුර ප්‍රකාරව ක්‍රියා කිරීම සුදුසු වේ. |
| (ආ) 2018 දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ හිඟ බදු වාර්තාව අනුව ගෙවිය යුතු ආර්ථික සේවා බදු (ESC) ශේෂය රු.12,904,494 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු එම බදු වටිනාකම රු.11,002,254 ක් ලෙස සටහන් කිරීම නිසා ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු වටිනාකම රු.1,902,240 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර තිබුණි. | ඉදිරියේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර මෙය නිවැරදි කරනු ඇත. | පිළිතුර ප්‍රකාරව ක්‍රියා කිරීම සුදුසු වේ. |

| | | |
|---|---|---|
| (ඇ) 2018 දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ හිඟ බදු වාර්තාව අනුව මණ්ඩලය විසින් ගෙවිය යුතු හිඟ ආදායම් බදු ශේෂය රු.16,276,328 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු ආදායම් බදු වටිනාකමක් සටහන් කර නොතිබුණි. | ඉදිරියේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර මෙය නිවැරදි කරනු ඇත. | පිළිතුර ප්‍රකාරව ක්‍රියා කිරීම සුදුසු වේ. |
| (ඈ) 2017 නොවැම්බර් සහ දෙසැම්බර් මාස වලට අදාළ එකතු වටිනාකම රු.300,000 ක් වූ වාහන කුළී වියදම්, 2018 වර්ෂයේ වාහන කුළී වියදම් ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ වාහන කුළී වියදම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | 2017 නොවැම්බර්, දෙසැම්බර් මෙම වියදම් 2018 වැය ලෙස ගිණුම්ගත කර ඇත. | වර්ෂයට අදාළ වියදම් එම වර්ෂය තුළ වූ වැය ලෙස හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව තොග වර්ග 04 ක එකතු තොග වටිනාකම රු.11,441,948 ක් වුවත්, 2019 පෙබරවාරි 12 දිනැති භෞතික සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව එම තොග අයිතම වල වටිනාකම රු.9,954,930 ක් වීම නිසා මූල්‍ය ප්‍රකාශන අනුව තොගය රු.1,487,018 ක් වැඩියෙන් සටහන් කර තිබුණි. | පරීක්ෂා කර බලා ඉදිරියේදී නිවැරදි කරනු ඇත. | පිළිතුර ප්‍රකාරව ක්‍රියා කිරීම සුදුසු වේ. |
| (ඊ) 2010 ජූලි මස සිට 2011 දෙසැම්බර් මස දක්වා සේවක අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවීම ප්‍රමාද වීම මත අර්ථ සාධක අරමුදල විසින් රු.14,289,605 ක අධිභාරයක් පනවා තිබුණි. 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල එම අධිභාර මුදල රු.7,896,291 ක් ලෙස සටහන් කිරීම නිසා ගෙවිය යුතු අධිභාර මුදල රු.6,393,314 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | විගණන මතය පිළිගනිමි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | පිළිතුර ප්‍රකාරව ක්‍රියා කිරීම සුදුසු වේ. |
| (උ) 2014, 2015 සහ 2017 ගිණුම් වර්ෂවල විගණන ගාස්තු සඳහා වන ඉන්වොයිස්පත්‍ර නිකුත් කිරීමට ජාතික විගණන කාර්යාලය වෙත එකඟතාවය පළ නොකිරීම නිසා, ඉන්වොයිස් පත්‍ර නිකුත් කිරීමට නොහැකි වී තිබුණි. එම වර්ෂ වෙනුවෙන් වූ එකතුව රු.592,432 ක ගෙවිය යුතු විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. | විගණන මතය පිළිගනිමි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | පිළිතුර ප්‍රකාරව ක්‍රියා කිරීම සුදුසු වේ. |

**1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| අතැති මුදල් | 150,199 | 88,275 | 61,924 | විගණන මතය පිළිගනිමි. ඉදිරියේදී මෙසේ සිදු නොවීමට වග බලා ගනිමි. | පිළිතුර ප්‍රකාරව ක්‍රියා කිරීම සුදුසු වේ. |

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල<br><br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) ඉඩම් හා ගොඩනැගිලි | 23,755,784 | හිමිකාරීත්වය තහවුරු කිරීම සඳහා හිමිකම් ඔප්පු හෝ වෙනත් නීත්‍යානුකූල ලියවිලි | මහියංගනය හා එරගම කම්හල් හැර සෙසු කම්හල් වල ඉඩම් 44 (I) වගන්තිය යටතේ පවරා ගැනීමට කටයුතු කරමින් පවතී. | මණ්ඩලයේ කම්හල් සතු ඉඩම් පවරා ගැනීම ප්‍රමාදව ඇති අතර, ඒවා කඩිනමින් සිදු කළ යුතුය. |
| (ආ) ලැබිය යුතු ආදායම් බදු | 1,221,666 | බදු ශේෂ තහවුරුව සඳහා වූ ලිඛිත සාක්ෂි | මේ ගැන සොයා බැලීමට කටයුතු කරමි. | සොයා බලා විගණනයට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) ගෙවිය යුතු මුළු බදු | 110,766,085 | බදු ලිපිගොණු හා ලිඛිත තහවුරු සාක්ෂි | සංස්ථාව සතුව ඇති ලිපිගොණුව ඉදිරිපත් ඉදිරිපත් කර නැත. | මෙම අගය සඳහා වන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) වෙළඳ හා වෙනත් ණයගැතියන් | 9,779,219 | ණය ශේෂ තහවුරුව සඳහා වූ ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි | මෙම විස්තර මූල්‍ය ප්‍රකාශනයේ සටහන් කර ඇත. | පිළිතුර අනුව මූල්‍ය ප්‍රකාශනවල මෙම අගය ඇත. ඒ සඳහා වූ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ඉ) වෙනත් තැන්පතු | 3,010,675 | නිවැරදිතාව තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්ෂි | මෙම ශේෂ ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | පිළිතුර ප්‍රකාරව නිවැරදි කළ යුතුය. |
| (ඊ) ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් ලැබිය යුතු ශේෂ | 5,000,000 | ශේෂ සනාථන ලිඛිත සාක්ෂි | ශේෂ සනාථන ඉල්ලා යවා ඇත. | ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (උ) ණයහිමි ශේෂ | 48,138,780 | ණයහිමි ශේෂය තහවුරු කිරීමට ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | පිළිතුර ප්‍රකාරව ක්‍රියා කිරීම සුදුසු වේ. |
| (ඌ) කර්මාන්තශාලා 05 ක බැංකු ජංගම ගිණුම් | - | බැංකු සැසඳුම් වාර්තා | මේවා සකස් කිරීමට ක්‍රියා කරමි. | පිළිතුර ප්‍රකාරව ක්‍රියා කිරීම සුදුසු වේ. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1. ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට එකතුව රු.52,753,241 ක් වූ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂයන් වසර 01 ට අඩු වූ ශේෂවල එකතුව රු.714,556 ක්ද, වසර 01 සිට වසර 02 දක්වා ශේෂවල එකතුව රු.1,276,046 ක්ද, වසර 02 සිට වසර 03 දක්වා වූ ශේෂවල එකතුව රු.500,012 ක්ද, වසර 03 ට වැඩි ණය ශේෂවල එකතුව රු.50,262,627 ක්ද වූ අතර, දිගුකාලයක සිට පැවත එන මෙම හිග ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ආයතනයේ මූල්‍ය දුෂ්කරතා මත ගෙවීම් පියවීම ප්‍රමාද වී ඇත. සොයා බලා නිවැරදි කිරීමට ක්‍රියා කරනු ඇත. | පිළිතුර ප්රකාරව සොයා බලා ගෙවිය යුතු වැය ගෙවීමට ක්‍රියා කළ යුතුය. |

## 1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 8 (1) වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මෙම ලේඛන පිළියෙල කර නොමැත. ඉදිරියේදී මෙය නිවැරදි කිරිමට කටයුතු කරනු ඇත. | වාර්ෂිකව අයවැය ලේඛන පූර්ව වසර තුළ පිළියෙල කර අනුමැතිය ලබාගත යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 135 | මුදල් රෙගුලාසි සම්බන්ධ කාර්යයන් ලිඛිතව පවරාදී නොතිබුණි. | ආයතනය තුළ මෙම කාර්යය සඳහා ප්‍රමාණවත් මාණ්ඩලික නිලධාරීන් නොමැත. | මෙම මුදල් රෙගුලාසිය අනුව ක්‍රියා කළ යුතුය. |
| (ඇ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 5 (1) වගන්තිය | චක්‍රලේඛය ප්‍රකාරව සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | පිළිතුර ප්‍රකාරව සංයුක්ත සැලසුම් සකස් කර අනුමැතිය ගෙන ඒ අනුව ක්‍රියා කළ යුතුය. |
| (ඈ) 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 02 වගන්තිය | චක්‍රලේඛය ප්‍රකාරව මණ්ඩලයට අයත් කම්හල් 06 කට අනුයුක්ත කළ වාහන 13 ක් භාවිතා නොකරන නමුත් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | වාහන අපහරණය සඳහා අමාත්‍යාංශ අනුමැතියට ඉදිරිපත් කර ඇත. | පිළිතුර ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛයට අනුකූල නොවන ලෙස මාණ්ඩලික නොවන සහ කොන්ත්‍රාත් සේවකයින් වෙත එකතුව රු.446,000 ක් අත්තිකාරම් ලෙස ලබාදී තිබුණි. | එදිනෙදා කාර්යය කර ගැනීම සඳහා දෛනික පදනමට බඳවා ගත් සේවකයින්ට අත්තිකාරම් ලබාදී ඇත. | චක්‍රලේඛයට අනුකූලව ක්‍රියා කිරීම සුදුසුවේ. |
| (ඊ) 2003 ජූනි 02 දිනැති පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| (I) 9.2 (බී) හා (ඩී) වගන්ති | මෙම වගන්තිය ප්‍රකාරව අනුමත කාර්ය මණ්ඩලයක් සහ සංවිධාන සැලැස්මක් සකස් කර, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ යුතු වුවත්, 2010 ජූලි 01 දින ප්‍රතිව්‍යුහගතකරණයෙන් පසුව සේවක මණ්ඩලය අනුමත කරගෙන නොතිබුණි. | අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර මේ පිළිබඳව සේවක සංඛ්‍යා අනුමත කර ගැනීමට කටයුතු කරමින් පවතී. | මෙම චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |
| (III)4.2.6 වගන්තිය | කාර්ය සාධන වාර්තාව මාස 03 කට වරක් සමාලෝචනය කර කාර්තුව අවසන් වී දින 30 ක් ඉකුත් වීමට පෙර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහ භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව සොයා බලා නිවැරදි කිරීමට ක්‍රියා කරනු ලැබේ. | මෙම චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |
| (උ) 2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය II වගන්තිය | මහාභාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ සේවකයින් 02 කු බඳවාගෙන එකතුව රු.130,000 ක් වැටුප් සහ දීමනා ලෙස ගෙවීම් කර තිබුණි. | නිසිබලධාරීවරයාට ඇති බලතල අනුව දෛනික පදනමට බඳවාගෙන ඇත. | මෙම චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |
| (ඌ) 2018 සැප්තැම්බර් 18 දින අංක පීඊඩී 01/2018 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු නොකර නිසිබලධාරීවරයාගේ පරිහරණය සඳහා මසකට රු.150,000 බැගින් කුළී පදනමට වාහනයක් මිලදීගෙන සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.1,800,000 ක් ගෙවීම් කර තිබුණි. | නිසිබලධාරී වෙත අළුතින් වාහනයක් මිලදී ගැනීමට අමාත්‍යාංශ අනුමැතිය ලැබෙන තෙක් මාසික ගෙවීම් පදනමට වාහනයක් ලබාදී ඇත. | මෙම චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |

## 1.2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

මණ්ඩලයේ සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.39,051,649 ක පාඩුවක් වූ අතර, ඊට ප්‍රතිවිරුද්ධව ඉකුත් වර්ෂයේ ලාභය රු.37,077,618 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.76,129,267 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ශුද්ධ විකුණුම් රු.53,983,079 ක් අඩු වී තිබීම සහ අනෙකුත් ආදායම් රු.4,230,894 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වාර්ෂිකව මණ්ඩලයේ නිෂ්පාදන ඒකක ප්‍රමාණය පිළිවෙලින් ඒකක 2,162,836 සිට ඒකක 4,368,412 දක්වා ක්‍රමයෙන් වර්ධනය වී තිබුණි. නමුත්, ඇස්බැස්ටස් තහනම ඉවත් කිරීමත් සමඟම උළු අලෙවිය අඩුවීම මත 2018 වර්ෂයේදී නිෂ්පාදනය ඒකක 1,642,804 ක් වීම නිසා 2017 වර්ෂයට සාපේක්ෂව නිෂ්පාදනය ඒකක 2,725,608 ක් එනම් සියයට 62 කින් අඩුවී තිබුණි. | උළු නිෂ්පාදන ඒකාරාශී වීම සහ උළු සඳහා වන ඉල්ලුම අඩුවීම මත කම්හල්වල අලෙවිය අඩුවීම නිසා 2018 ජනවාරි 25 සිට නිෂ්පාදන කටයුතු තාවකාලිකව නතර කර ඇත. එය මුළු නිෂ්පාදනය පහළ යාමට හේතුවී ඇත. | රාජ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ලෙස දුන් උපදෙස් ප්‍රකාරව කම්හල් බඳු දීමට කඩිනමින් ක්‍රියා කළ යුතුය. භාණ්ඩාගාර උපදෙස් ලබා ගැනීම සුදුසු වේ. |
| (ආ) 2018 වර්ෂයේ ජනවාරි මස දක්වා කර්මාන්තශාලා 05 ක් නිෂ්පාදන කටයුතු සඳහා භාවිතා කර තිබුණි. නමුත් උළු අලෙවියේ ගැටළු මත එරගම කම්හල හැර සෙසු කම්හල් 04 2018 ජනවාරි 25 දින සිට තාවකාලිකව නිෂ්පාදන නතර කර තිබුණි. 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේ නිෂ්පාදන ඒකක ගණන සැසඳීමේදී, එරගම කම්හල සියයට 18 කින්ද, මහියංගනය කම්හල සියයට 90 කින්ද, යටියන කම්හල සියයට 92 කින්ද, බිංගිරිය කම්හල සියයට 94 කින් සහ උස්වැව කම්හල සියයට 96 කින් නිෂ්පාදන ධාරිතාවය සමාලෝචිත වර්ෂයේදී පහත බැස තිබුණි. | උළු අලෙවි ගැටලු මත සහ ඇස්බැස්ටස් තහනම ඉවත් කිරීමත් සමඟ මේ තත්ත්වය සිදුව ඇත. ආයතනය 2018 වර්ෂය තුළ උළු අලෙවි ගැටලු නිසා නිෂ්පාදනය නතර කර ඇත. | අමාත්‍යාංශය මඟින් ඍජු මැදිහත්වීමක් ලබාගෙන පවත්නා රජයේ ප්‍රතිපත්ති හා තීරණ අනුව ක්‍රියා කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම සැසඳීමේදී එරගම කම්හල සියයට 28 කින්ද, බිංගිරිය කම්හල සියයට 51 කින්ද, මහියංගනය කම්හල සියයට 69 කින්ද, යටියන කම්හල සියයට 68 කින් සහ උස්වැව කම්හල සියයට 72 කින් විකුණුම් අඩුවී තිබුණි. | ඇස්බැස්ටස් තහනම ඉවත් කිරීම නිසා සහ නිෂ්පාදන අලෙවිකරණ ගැටලු මත මෙය සිදුව ඇත. | නිෂ්පාදිත උළු හානි වීමට පෙර අලෙවි කර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

## 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය සතු කම්හල් 09 න් කම්හල් 04 ක් අමුද්‍රව්‍ය හිඟය, උතුරු නැගෙනහිර පැවති යුද්ධය සහ ප්‍රතිව්‍යුහගකරණය මත සේවකයින් ඉවත් කිරීම වැනි හේතූන් මත වසා දමා තිබුණි. එම කම්හල්වල නිෂ්පාදන කටයුතු වසර 04 සිට වසර 26 දක්වා කාල පරිච්ඡේදයක සිට නතර කර තිබුණි. එම කම්හල් 04 සතු එකතුව රු.17,517,840 ක් වටිනා දේපළ පිරියත හා උපකරණ, අක්කර 88 රූඩ් 02 ක ඉඩම ඵලදායී කාර්යයකට යෙදවීමකින් තොරව නිශ්කාර්යාව පැවතුණි. | මෙම කම්හල් සඳහා වන සුදුසු ව්‍යාපෘති සලකා බලා කැබිනට් තීරණය අනුව කටයුතු කිරීමට අදහස් කර ඇත. | වත්කම් ආරක්ෂා කිරීමට හා කඩිනමින් ඵලදායී ආයෝජනයක යෙදවීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) මණ්ඩලය සතු කර්මාන්තශාලා දීර්ඝකාලීනව පෞද්ගලික ආයෝජකයෙකුට බදු දීමේ මූලික අරමුණු ඇතිව අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය ඉවත් කර 2010 වර්ෂයේ ජූලි 01 දින සිට නිසිබලධාරීවරයෙකු පත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය වන විට නිසිබලධාරීන් 03 දෙනෙකු කාලීනව පත්කර තිබුණද, 2019 ජූලි 31 දින වන විටත් කර්මාන්තශාලා කිසිවක් බදු දීමට නොහැකි වී තිබුණි. | ඉදිරියේදී මෙම කම්හල් බදු පදනමට ලබාදීමට කටයුතු කරනු ලැබේ. | පිළිතුර ප්‍රකාරව මෙම වාර්තාවේ දින තෙක් ක්‍රියා කර නැත. කඩිනමින් කම්හල් බදු දීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) මණ්ඩලය යටතේ ඇති එරගම උළු කම්හලට අයත් අක්කර 50 ක කුඹුරු ඉඩම, 2018 මාර්තු 15 දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ වගා කිරීමකින් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි. | මෙම ඉඩම බදු දීමට කටයුතු කරමින් පවතී. | මෙම කුඹුරු ඉඩම ඵලදායී ආයෝජන කාර්යයකට යෙදවිය යුතුය. |

### 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ පුරා විද්‍යා දෙපාර්තමේන්තුවට ඉංජිනේරු ගඩොල් කැට 245,572 ක් රු.4,051,938 කට සැපයීමට සංස්ථාව සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව අතර, එකඟතා ගිවිසුමකට 2018 අගොස්තු 29 දින එළඹී තිබුණි. නමුත් 2018 දෙසැම්බර් 31 දිනට ගඩොල් කැට 57,157 ක් පමණක් එනම් මුළු ඇණවුමෙන් සියයට 23 ක් පමණක් සැපයීම් කර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.3 ප්‍රකාරව ගිවිසුමේ වලංගු කාලය දීර්ඝ කර ගැනීමට හෝ නව ගිවිසුමකට එළඹීමකින් තොරව ඉතිරි ගඩොල් සැපයීම 2019 වර්ෂය තුළ සිදු කර තිබුණි. | එම ආයතනය සමඟ සාකච්ඡා කර පූර්ව වර්ෂයේ ලබාගත් ඇණවුම එම එකඟතා මත ලබාදීමට කටයුතු කරන ලදී. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව ක්‍රියා කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය සමාලෝචිත වර්ෂයේ පළමු කාර්තු 03 සඳහා පමණක් අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙල කර තිබූ අතර, එම සැලැස්ම මගින් ක්ෂේත්‍ර 10 ක් ආවරණය කිරීමට සැලසුම් කර තිබුණි. නමුත් වර්ෂය තුළදී ක්ෂේත්‍ර 04 ක් පමණක් අභ්‍යන්තර විගණන අංශය මගින් ආවරණය කර තිබීම නිසා ආයතනයේ අභ්‍යන්තර විගණනයේ ක්‍රියාකාරීත්වය දුර්වල මට්ටමක පැවතුණි. | ඉදිරියේදී උපදෙස් හා සැලසුම් අනුව ක්‍රියා කරනු ඇත. | වාර්ෂිකව විගණන සැලැස්මක් සකස් කළ යුතු අතර, එය නියමිත පරිදි ක්‍රියාත්මක කළ යුතුය. |